# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2127/29 - 2019 ජුනි මස 14 වැනි සිකුරාදා - 2019.06.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධන) පනතින් සංශෝධිත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 (2අ) වන වගන්තිය යටතේ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ බලතල පැවරීම සම්බන්ධයෙන් වූ නියමයයි

1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධන) පනතින් සංශෝධිත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(2අ) වන උපවගන්තිය ප්‍රකාරව බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධරයන් පත් කිරීම, මාරු කිරීම, උසස් කිරීම, සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය සම්බන්ධයෙන් බලතල පැවරීමට අදාළව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2082/7 දරන 2018 ජූලි මස 31 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයට* ඇතුළත් 2018.06.26 දිනැති නියමයෙහි උපලේඛන අංක 01 යටතේ ගත් ක්‍රියාමාර්ගයකට අගතියකින් තොරව එම උපලේඛනය ඉවත් කර ඒ වෙනුවට උපලේඛන අංක 01 වශයෙන් මෙහි පහත සඳහන් උප ලේඛනය ඇතුළත් කරමින් 2019 ක් වූ මැයි මස 16 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කරන බව මෙයින් නිවේදනය කරමි.

සුනිල් අබේවර්ධන,
සභාපති,
පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත.

2019 මැයි මස 16 වැනි දින
බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 109,
මහ වීදිය, බත්තරමුල්ල.

1A - PG 4536 — 117 (2019/06)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛන අංක 01**

| I තීරුව<br>බලතල පවරනු ලබන නිලධරයන් | II තීරුව<br>නිලධාරි ගණය | III තීරුව<br>පවරන ලද බලතල |
|---|---|---|
| 1. ප්‍රධාන ලේකම් | (I) දීප ව්‍යාප්ත සේවාවන් වලට අයත් නිලධාරීන්<br>i. ශ්‍රී ලංකා පරිපාලන සේවය<br>ii. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය<br>iii. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය<br>iv. ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය<br>v. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය<br>vi. ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය<br>vii. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය<br>viii. ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය<br>ix. ශ්‍රී ලංකා වෛද්‍ය සේවය<br>x. ශ්‍රී ලංකා දේශීය වෛද්‍ය සේවය<br>xi. ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය<br>xii. ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය | (අ) බස්නාහිර පළාත් රාජ්‍ය සේවයට පත් කිරීම.<br>(ආ) බස්නාහිර පළාතේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු හා ආයතනයන්හි තනතුරුවලට ස්ථානගත කිරීම.<br>(ඇ) බස්නාහිර පළාතේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන අතර ස්ථාන මාරු කිරීම.<br>(ඈ) බස්නාහිර පළාත් රාජ්‍ය සේවයෙන් මුදා හැරීම. |
| | (II) දීප ව්‍යාප්ත සේවාවන් වලට අයත් නිලධාරීන් (අධ්‍යාපන පරිපාලන සේවය හැර) | (අ) විනය පාලනය (රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමයන්ට යටත්ව)* |
| | (III) බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත්වීම් බලධාරියා වන :-<br>(i) SL වැටුප් බණ්ඩය දරණ නිලධාරීන් (පළාත් පාලන ආයතනවලට සීමාවූ SL වැටුප් බණ්ඩය දරණ තනතුරු හැර) | (අ) අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/ ආයතන අතර ස්ථාන මාරු කිරීම<br>(ආ) සේවයෙන් පහ කිරීම හා විනය පාලනය |
| | (IV) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව තෘතීය හා ද්විතීය මට්ටම් වලට අයත් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත්වීම් බලධාරියා වන :-<br>(i) SL වැටුප් බණ්ඩයට අයත් නොවන නිලධාරීන්. | (අ) ප්‍රධාන ලේකම් කාර්යාලය හා ප්‍රධාන ලේකම් කාර්යාලයට අනුබද්ධිත ආයතන අතර ස්ථාන මාරු කිරීම හා විනය පාලනය<br>(ආ) අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/ ආයතන අතර ස්ථාන මාරු කිරීම. |
| | (V) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව ප්‍රාථමික මට්ටමට අයත් MT-1, MN-1 හා PL වැටුප් බණ්ඩය දරණ තනතුරුධාරීන් | (අ) බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය හා ප්‍රධාන ලේකම් කාර්යාලයට අනුබද්ධිත ආයතනවල තනතුරුවලට පත් කිරීම, උසස් කිරීම හා ස්ථාන මාරු කිරීම, සේවයෙන් පහ කිරීම හා විනය පාලනය.<br>(ආ) පළාත් පාලන ආයතන හැර අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ආයතන අතර ස්ථාන මාරු කිරීම<br>(ඇ) කණිෂ්ඨ සේවකයින්ගේ අන්තර් පළාත් අනුයුක්ත කිරීම්/මුදා හැරීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම. |

* සටහන:

"රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමයන්ට යටත්ව" යන්නෙන් අදහස් වන්නේ,

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් දැනටමත් පනවා ඇති සහ ඉදිරියේදී පනවනු ලැබිය හැකි නියමයන්ට යටත්ව කටයුතු කිරීම වේ.

06 - 706

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.